# අපනයනයට සුදුසු කෘෂි නිෂ්පාදන

දෙවන ලෝක යුද සමයේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ කර්මාන්ත කටයුතු අපනයන මූලික වැවිලි වගාවන් වූ තේ, රබර්, පොල් නිෂ්පාදන සැකසීමට සීමා විය. මෙම තත්ත්වය පැවැතියේ, මෙ රට ප්‍රාථමික කෘෂිකාර්මික රටක් සේ සළකා කෘෂි නිෂ්පාදන ද්‍රව්‍යය අපනයනය කිරීමෙන් ලැබෙන විදේශ විනිමය මගින් රටට අවශ්‍ය කාර්මික භාණ්ඩ එතරින් ආනයනය කළ යුතුය යන ප්‍රතිපත්ති එවකට පැවැති යටත් විජිත ආණ්ඩු අනුගමනය කළ හෙයිනි.

කෙසේ වෙතත් මෑත කාලයේදී මෙම සාම්ප්‍රදයික අපනයනයන්ගේ ඉපැයුම පහළ බසින්නට පටන් ගත්තේය. මෙම පහළ බැසීම නිසා අපනයනය සඳහා නව නිෂ්පාදන පමණක් නොව සේවාවන්ද බිහි කිරීම ආරම්භ කිරීම අත්‍යාවශ්‍ය කටයුත්තක් බවට පත් විය. අපගේ සාම්ප්‍රදයානුකූල හා සාම්ප්‍රදයානුකූල නොවූ සියලු අපනයනයන් ලෝක වෙළඳ පොළේ දැඩි තරඟ කාරීත්වයකට භාජනය වූ නිසා සැපයුම් මාර්ග හා නිෂ්පාදනයන් වර්ධනය කිරීමට අමතරව, පලදායිතාවය, තත්ත්වය හා ඇසුරුම් යන අංශයන්හි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, සාර්ථක අපනයන ව්‍යාපාරයක් සඳහා පූර්ව අවශ්‍යතාවයක් බවට පත් විය.

මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහාත් අපගේ ස්වාභාවික කෘෂිකර්ම හා ඛනිජ සම්පත් වලින් අපනයනය සඳහා උසස් නිෂ්පාදන බිහි කිරීමෙහිලාත්, මෙරටේ රසායනඥයන් ඇතුළු විද්‍යා ක්ෂේත්‍රයෙහි විශේෂඥයන්ට මහඟු කාර්ය භාරයක් ඉටු කිරීමට ඇත්තේය.

අපනයන සඳහා උපයෝගී කර ගත හැකි ප්‍රධාන ක්ෂේත්‍ර සලකා බලමු.

### කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත

ශ්‍රී ලංකා ආර්ථිකයේ සාම්ප්‍රදයානුකූල මූලය වූ කෘෂිකර්මය ජාතික ආදයමෙන් විශාල කොටසක් උපයන අතර, රටේ ජනගහනයෙන් බහුතරයක ගේ ජීවනෝපායද සලසයි.

මේ නිසා තේ, රබර්, පොල් සහ සහල් යන මේ රටේ ප්‍රධාන තම කෘෂිකාර්මික වගාවන් වල පර්යේෂණය හා සංවර්ධනය සඳහා එක් එක් භෝගය වෙනුවෙන් පර්යේෂණ ආයතන පිහිටුවා ඇත. කෙසේ නමුදු, මෑතක් වන තුරු මෙම ක්ෂේත්‍රවල සංවර්ධන හා පර්යේෂණ කටයුතු අභිජනනය, වගා කටයුතු හා මූලික සැකසීම් වැනි කෘෂි කාර්මික කටයුතු වලට සීමාවී තිබිණ. මෙම භෝග වල, අස්වැන්නෙන් පසු කටයුතු, ද්විතියන සැකසුම්, සහ කෘතිය කටයුතු වන අලෙවිය වැනි අංශ කෙරෙහි ද, ඒකාබද්ධ ක්‍රියාවලින් ආරම්භ කිරීම මෙම භෝග වලින් වඩාත් ඵලදායක අපනයන ප්‍රතිඵල ලබා ගැනීමට හේතුවනු ඇත.

### එළවළු හා පළතුරු කර්මාන්තය

ශ්‍රී ලංකාව දනට එළවළු හා පළතුරු වර්ග රාශියක් වගා කරන අතර, දේශගුණික හා අනිකුත් අංග නිසා මෙම ප්‍රමාණය තවත් වර්ග ගණනාවක් සඳහා ව්‍යාප්ත කළ හැකිය. අලුත් පලතුරු හා එළවළු වශයෙන් පමණක් නොව ටින් කළ, වියළූ හා කල් පවතින ආකාරයට සකස් කළ භාණ්ඩ ලෙසද

අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති

**අශෝක ලැනරෝල්**

මෙම ද්‍රව්‍ය වලට අපනයන වෙළෙඳාමේ ඉඩ ප්‍රස්ථා රාශියක් ඇත. කෙසේ නමුදු, විශේෂයෙන් මෙම ද්‍රව්‍ය නිපදවීම අවුරුද්දේ එක් කාලයකට හා යම් යම් ප්‍රදේශ වලට පමණක් සීමාවීම නිසා මෙහි පරිහරණය, කල් තබා ගැනීමේ ක්‍රම, ගබඩා කිරීම හා ප්‍රවාහනය යන අංශවල තාක්ෂණය දියුණු කළ යුතු වෙයි. මෙයට අමතරව අස්වැන්නෙන් පසුව වන හානි ප්‍රමාණය, පළතුරු හා එළවළු යන දෙවර්ගයෙහිම ඉතා ඉහළ බව ප්‍රචලිතය. එනිසා, මෙම ද්‍රව්‍යයන් ප්‍රමිතිකරණය හා ආහාර සැකසීම යන අංශ වලදී වැඩි තාක්ෂණික හා විද්‍යාත්මක ආධාර අපේක්ෂා කරන අංශ බවට නිතැතින්ම පත් වී ඇත.

### කුළුබඩු කර්මාන්තය

ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකාව කුළුබඩු වලට ප්‍රසිද්ධියක් උසුලන නමුදු, මේ දක්වාම මෙම ද්‍රව්‍ය වැඩි වශයෙන් අපනයනය කරනු ලබන්නේ ප්‍රාථමික ආකාරයෙනි. කුරුඳු, එනසාල්, ගම්මිරිස් හා සාදික්කා වැනි ද්‍රව්‍යය සැකසීම මගින් වැඩි වටිනාකමක් සහිත නව නිෂ්පාදන බිහි කළ හැකිය. මෙම ද්‍රව්‍යයන් මගින් තෙල් හා තෙලෝදය නිෂ්පාදනයන් වඩා ප්‍රගුණ කළ යුතුය.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදනයන් වන අත්‍යවශ්‍ය තෙල්, විදේශ වලදී ඉතා මිළ අධික ද්‍රව්‍යය වන සුවඳ විලවුන්, ආහාර රස කාරක හා ඖෂධ ආදිය නිපදවීමේ මූලය ලෙස යොදා ගනු ලැබේ. මෙම තත්ත්වයට උචිතම අරමුණ විය යුත්තේ මෙම ද්‍රව්‍ය තව දුරටත් සකස්කර වටිනා භාණ්ඩ බවට පත් කිරීම වුවද, ලෝක වෙළෙඳ පොළේ මෙම ක්ෂේත්‍රයෙහි වෙළෙඳාමට ඇති ඉඩකඩ සීමා සහිත බවත්, එය ලෝක මට්ටමේ නිෂ්පාදකයන්ගේ ඒකාධිකාරයක් බවට පත් වී ඇති බවත් අප විසින් මෙනෙහි කළ යුතුය. කෙසේ වෙතත් මනා ලෙස සැළසුම් කළ භාණ්ඩ මූලික ක්‍රියාවලියක් තුලින් මෙම ක්ෂේත්‍රයෙහි ඉපැයුම් වර්ධනය කිරීමට ශ්‍රී ලංකාවට ඉඩකඩ සැළසෙනු ඇත.

### ඖෂධීය පැලෑටි ආශ්‍රිත කර්මාන්ත

පර්යේෂණ හා සංවර්ධන වැඩ සටහන් තුළින් තව දුරටත් වර්ධනය කළ හැකි ක්ෂේත්‍රයක් ලෙස මේ අංශය හැඳින්විය හැකිය. එබඳු කටයුතු, අපනයන සඳහා වාණිජ වටිනාකමක් ඇති ඖෂධීය පැලෑටි වගා කිරීම හා සැකසීම (පළමුව දළ ලෙස යුෂ ලබා ගැනීම හා දෙවැනිව අවශ්‍ය මූලික ද්‍රව්‍ය වෙන්කර ගැනීම) යන දෙඅංශය කෙරෙහි යොමු කළ යුතුය.

මෙයට අමතරව වැඩිදුර පර්යේෂණ හා සංවර්ධන වැඩ සටහන් මගින් ආදයම් ලබා ගත හැකි නිෂ්පාදන ක්ෂේත්‍ර රාශියක් ඇති බවද සැලකිය යුතුය.

මෙම ක්ෂේත්‍ර සියල්ලම, කාර්මික සැකසීම් මගින් ව්‍යාප්ත කිරීමෙ හා උසස් මට්ටමකට දියුණු කිරීමේ හැකියාවන් ඉතා බහුල නිසා රාජ්‍ය හා පෞද්ගලික දෙ අංශයම එම අරමුණු ඉටු කිරී සඳහා පර්යේෂණ පැවැත්වීම පිණිස යෙදවුම් යෙදවිය යුතුය යන්න පිළිගත් මතයකි.

— දෙසුමකින් සකස් කරන ලදී. —